15 වන පිටෙන්

නීති සැදීමට පළාත් සභාවකට මධ්‍යම රජයේ අනුමැතිය ගැනීමට අවශ්‍යවේ . උදා .ලෙසඃ හෙට දින නැගෙනහිර ප්‍රධාන ඇමති විසින් වයස අවුරුදු 12 න් පහල ගැහැණු ළමයින්ට විවාහ වීමට අවසර දියයුතුයි නීතියක් ගෙන ආවොත් මධ්‍යම රජයට එය නැවතිය හැක්කේ විවාහ විෂයය සමගාමී ලැයිස්තුවේ තිබෙන නිසාය. තවද "කුමන" අභය භූමිය අක්කර 500 ක් එලි කර තට්ටු නිවස සෑදීමටත් , දීඝවාපි පරිවාර චෛත්‍යය ඩෝසර් කොට කර්මාන්ත ශාලාවක් සෑදීමටත් නීති ගෙනාවොත් මධ්‍යම රජයට ඒවා නැවතිය හැක්කේ පිළිවෙලින් "පරිසරය" සහ " නටබුන්" සමගාමී ලැයිස්තුවේ තිබෙන නිසාය . ධර්මලිංගම් සිද්ධාර්තන් ගේ අනෙක් නිර්දේශය වන්නේ සමගාමී ලැයිස්තුව අහෝසි කිරීමයි .

එසේනම් ආණ්ඩුකාරවරයාගේ බලතල අහෝසි කොට සමගාමී ලැයිස්තුව අවලංගු කළහොත් තම තමන්ට කැමති විදියේ නීති සැදිය හැකි, මධ්‍යම රජයේ පාලනයෙන් තොර, ස්වාධීන පළාත් නවයක් රටේ බිහිවනු ඇත . එනම් රට ෆෙඩරල් වීමයි. ජනතාවගෙන් සත්‍යය වසන් කොට ශ්‍රීලාල් සෙනෙවිරත්න එසේනම් මේ සදාරණීය කිරීමට වෑයම් කරන්නේ රට පළාත් නවයකට බෙදන මෙම ඊනියා ෆෙඩරල් ව්‍යවස්තාව බව ඔස්ට්‍රේලියාවේ වෙසෙන ඔබේ මව්බිමට හිතැති ඔබ සැම තේරුම් ගතයුතුය.

මෙසේ සඳහන් කලේ යෝජිත නව ව්යබවස්ථාවේ රට ෆෙඩරල් බවට පත්කරන ප්‍රධාන කරුණු දෙකක් පමණි. තවත් කරුණු බොහෝ ඇතත් ලිපිය දීර්ඝ වන බැවින් නොලියමි .එසේ නම් රටේ බහුතර ජනතාවටත් අවශ්‍ය නැති, දෙමල බෙදුම්වාදීන්ට සහ බටහිර රටවලට අවශ්‍ය , අපේ මාතෘභූමිය ෆෙඩරල් රාජ්‍යයක් බවට පත්කරන, මෙම ඊනියා ව්‍යවස්ථා සංශෝදනය සම්මත කිරීම හෝ එයට අනුබල දීම හෝ දේශයට ද්‍රෝහී වීමක් නොවන්නේ කෙසේද යන්න ශ්‍රීලාල් සෙනෙවිරත්න මීළඟ සන්නස කලාපයේදී ඔබ සැමට පැහැදිලි කර දිය යුතු වේ .

අවසාන වශයෙන් ශ්‍රීලාල් මා සම්බන්දයෙන් පවසා ඇති "ගාමිණී වියන්ගොඩ" සහ " මරණීය දණ්ඩනය" ගැනද යමක් සඳහන් කල යුතුය. මෙහිදීද , ඉහතදී මෙන් ඔහු උත්සාහ කරන්නේ අප පිළිඹදව වැරදි හැඟීමක් ඔබට ලබා දීමටය . මා පෙර සඳහන් කල ජිනීවා යෝජනාවට අනුව, එහි සඳහන් නියෝග ප්‍රකාර, මෙහි " සංහිඳියාව උදෙසා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායක් , " Task Force for Reconciliation Mechanism ස්ථාපිත කරනලදී. ගාමිණී වියන්ගොඩ, පාක්යරසෝති සරවනමුත්තු, මනෝරි මුත්තෙට්ටුවේගම ඇතුළු එකොලොස් දෙනෙකුගෙන් සමන්විත එම කමිටුවේ කාර්යය වුයේ සංහිඳියාව උදෙසා නිර්දේශ එක්සත් ජාතීන්ගේ සංගමයට ඉදිරිපත් කිරීමයි . මීට මාස කිහිපයකට පෙර ඔවුන් ඉදිරිපත් කල වාර්තාවේ අඩංගු නිර්දේශ කිහිපයක් පමණක් මෙසේය . එනම්ඃ රට අනාගමික වියයුතුයි , පෙර කරන ලද යුද අපරාධ ජාතයන්තර යුද අපරාධ සේ සෑලකියයුතුයි , "නව ෆයවස්ථාවක්" ගෙන ආ යුතුයි , හමුදාව සුබ සාධන කටයුතු වලින් ඉවත් විය යුතුයි , මිය ගිය ත්‍රස්තයින් ස්මරණය කිරීමේ අයිතිය දිය යුතුයි ,යුද අපරාධ සඳහා දෙමුහුන් අධිකරණයක් ස්ථාපිත කල යුතුයි , දෙමල විරෝධී වධ බන්ධන ඇතුළු මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පාසල් ඉතිහාස පොත්වල ඇතුලත් කල යුතුයි , ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කල යුතුයි, යුද්ධයේදී මියගිය සියල්ලන්ට , ත්‍රස්තයින්ද ඇතුළුව , රජයෙන් වන්දි ලබා දියයුතුයි , යනාදියයි . කොටි සංවිධානයේ ඇන්ටන් බාලසිංහම් හෝ තමිල් චෙල්වම් හෝ මෙම කොමිටියේ සිටියේ නම් ඔවුන් වුවද මෙවන් නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙවරක් සිතනු නොඅනුමානයි . මෙම වාර්තාව නිකුත් වූ විගස එයට සුභ පැතුවේ ගෝලීය ද්‍රවිඩ සන්ධානයයි , ඉන් පසුව සුභ පැතුවේ එ ජා සං යේ සේඉඩ් අල් හුසේන් ය . එසේනම් මෙවන් තීරණාත්මක අවදියක මෙවන් වාර්තාවක් නිකුත් කිරීම දේශයට ද්‍රෝහී වීමක්ද නැතහොත් දේශයට "ප්‍රේම කිරීමක්ද යන්න ඔබට හොඳින් තේරුම් යනවා ඇත.

එදින රූපවාහිනී නාලිකාවේ ගාමිණී වියන්ගොඩ ඉදිරියේ මා පැවසුවේ මෙයයි . එනම් තමන් උපන් දේශයට ද්‍රෝහී වීම රටක වැසියෙකුට කිරීමට හැකි බරපතලම වැරැද්දක් වන අතර තමන් කරනලද එම දේ තම දේශයට ද්‍රෝහිවීමක්ද නැද්ද යන්න තීරණය කරන්නේ අප නොව අධිකරණය බවයි . ලෝකයේ වෙනත් ඕනෑම රටක මෙන් අපේ රටේද දේශද්‍රෝහී චෝදනාවට වරදකරු වන සියල්ලන්ටම දෙන එකම දඬුවම මරණීය දණ්ඩනයයි. ඉදිරියේ එන දේශප්‍රේමී රජයකට අප නිර්දේශ කරනුයේ ජනතාවට අනුව දේශයට ද්‍රෝහිවූ සියල්ලන්ට එරෙහිව නඩු පවරන ලෙසයි .වසර දහස් ගණනක් තිස්සේ රැකගත් රටේ ඒකීය භාවය විනාශ කිරීමට අනුබල දීම දේශයට ද්‍රෝහිවීමක්ද නැද්ද යන්න තීරණය කරන්නේ පෙර කිව් පරිදි අප නොව අධිකරණයයි. අපට කල හැක්කේ එල්ලුම්ගස නැවත ක්‍රියාත්මක කලයුතු බව තරයේ කියා සිටීම පමණි . ශ්‍රීලාල් සෙනෙවිරත්න මේ යථාර්තය දැන්වත් තේරුම් ගෙන විදේශයේ සිටින අපගේ දේශප්‍රේමී සිංහල ජනතාව මින් ඉදිරියට හෝ නොමග යැවීමට ඉහත සඳහන් ආකාරයේ බාල ප්‍රයත්නයන් නොගනු ඇතැයි සිතමි .

## විනී හෙට්ටිගොඩ




# Glaring prospect of the best of international cricket 1n 2018:

## early signs give signals



By Dr Mathu H Liyanage

Alatair Nathan Cook has signalled that 2018 will be full of spectacular and entertaining international cricket by his score of 244 not out in the fourth Ashes Test by a visiting batsman at the MCG, surpassing West Indies Viv Richards' 208 in 1984. Bob Cowper holds the overall record at the ground with his score of 307 in 1966. Cook scored the 244 not out in 409 balls with 631 maidens and 27 fours.

Cook is poised to become the first batsman to carry his bat through a completed innings at the MCG. He would be the eighth English batsman to achieve this feat at any ground, and the first since Mike Atherton in 1997. It was his fifth double century, his highest score against Australia and the third-highest of his Test career. He



surpassed Brian Lara and Shivnarine Chanderpaul (West Indies), and Mahela Jayawardene (Sri Lanka) to become the sixth-highest scorer in Test cricket with 11,956 runs.

Alstair Cook, born on December 25 !984, is an English cricketer. He was a former Skipper of English Test and One Day International (ODI) Teams.

He is regarded as one of the greatest batsmen ever to play for England and one of the most prolific batsmen in the modern era.